**ශීර්ෂය 231 - ණය සහනදායක මණ්ඩලීය දෙපාර්තමේන්තුව**

---

1. **මූල්‍ය ප්‍රකාශන**

## 1.1 තත්ත්වාගණනය කළ මතය

ණය සහනදායක මණ්ඩලීය දෙපාර්තමේන්තුවේ 2018 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය ප්‍රකාශය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය හා මුදල් ප්‍රවාහ ප්‍රකාශවලින් සමන්විත 2018 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශය 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව ණය සහනදායක මණ්ඩලීය දෙපාර්තමේන්තුවේ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් ඇතුළත් සම්පිණ්ඩන වාර්තාව 2019 මැයි 31 දින ගණන්දීමේ නිලධාරී වෙත නිකුත් කරන ලදී. විගණන පනතේ 11(2) වගන්තිය ප්‍රකාරව දෙපාර්තමේන්තුවට අදාළ වාර්ෂික විස්තරාත්මක කළමනාකරණ විගණන වාර්තාව 2019 මැයි 22 දින ගණන්දීමේ නිලධාරී වෙත නිකුත් කරන ලදී. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 10 වගන්තිය ප්‍රකාරව මෙම වාර්තාව පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලැබේ.

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2018 දෙසැම්බර් 31 දිනට ණය සහනදායක මණ්ඩලීය දෙපාර්තමේන්තුවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

## 1.2 තත්වාගණනය කළ මතය සඳහා පදනම

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් මාගේ වගකීම, විගණකගේ වගකීම යන වගන්තියේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබා ගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

## 1.3 මූල්‍ය ප්‍රකාශය සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ හා ගණන්දීමේ නිලධාරීගේ වගකීම

පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව හා 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වගන්තියේ සඳහන් විධිවිධානවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිඹිබු කෙරෙන පරිදි මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම හා වංචා සහ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම ගණන්දීමේ නිලධාරීගේ වගකීම වේ.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) වගන්තිය ප්‍රකාරව දෙපාර්තමේන්තුව විසින් වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වා ගෙන යා යුතුය.

ජාතික විගණන පනතේ 38(1)(ඇ) උප වගන්තිය ප්‍රකාරව දෙපාර්තමේන්තුවේ මූල්‍ය පාලනය සඳහා සඵලදායි අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස් කර පවත්වා ගෙන යනු ලබන බවට ගණන්දීමේ

නිලධාරී සහතික විය යුතු අතර එම පද්ධතියේ සඵලදායිත්වය පිළිබඳව කලින් කල සමාලෝචනයක් සිදු කර ඒ අනුව පද්ධතිය ඵලදායි ලෙස කර ගෙන යාමට අවශ්‍ය වෙනස්කම් සිදු කරනු ලැබිය යුතුය.

## 1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය පිළිබඳ විගණකගේ වගකීම

------------------------------------------------------

සමස්ථයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා හා වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකාධිපති සම්පිණ්ඩන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැම විටම ප්‍රමාණාත්මක අවප්‍රකාශයන්ගෙන් තොර බවට තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක අවප්‍රකාශනයන් ඇති විය හැකි අතර, මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කර ගනිමින් පරිශීලකයන් විසින් ආර්ථික තීරණ ගැනීමේදී ඒ පිළිබඳව සැලැකිලිමත් විය යුතුය.

වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය කරන ලදී. මා විසින්,

- වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගේ අවදානම් හඳුනාගැනීමේදී හා තක්සේරු කිරීමේදී අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කිරීමෙන් වංචා සහ වැරදි හේතුවෙන් ඇතිවන්නා වූ අවදානම් මඟ හරවා ගැනීමට, ප්‍රමාණවත් සහ සුදුසු විගණන සාක්ෂි ලබා ගැනීම මාගේ මතයට පදනම් වේ. ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන අතර, දූස්සන්ධානය, ව්‍යාජ ලේඛන සැකසීම, චේතනාන්විත මඟහැරීම, හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීම වංචාවක් ඇතිවීමට හේතුවේ.
- අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස දෙපාර්තමේන්තුවේ අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳ මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි.
- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය සහ අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව ඇගැයීම.
- සමස්ථයක් ලෙස මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීමේදී, මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව,

මාගේ විගණනයෙන් හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව ගණන්දීමේ නිලධාරී දැනුවත් කරන ලදී.

## 1.5 වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව

--------------------------------------------

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(ඇ) වගන්තිය හා 38 වගන්තිය ප්‍රකාරව පහත සඳහන් කරුණු මා ප්‍රකාශ කරමි.

**(අ)** ඉකුත් වර්ෂය සඳහා මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේ අවශ්‍යතාවයක් නොතිබුණු බැවින් සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූපී වන බව ප්‍රකාශ කළ නොහැකි විය.

**(ආ)** ණය සහනදායක මණ්ඩලීය දෙපාර්තමේන්තුව විසින් ඉකුත් වර්ෂයට අදාළව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේ අවශ්‍යතාවයක් නොතිබුණු බැවින් මූල්‍ය ප්‍රකාශන පිළිබඳ නිර්දේශ ඉදිරිපත් කර නොතිබුණි.

## 1.6 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

-----------------------------------------

### 1.6.1 මූල්‍ය කාර්යසාධන ප්‍රකාශන

-------------------------------

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| **(අ)** මූල්‍ය ප්‍රකාශ සමඟ වූ ඒසීඒ 5 ආකෘතිය අනුව රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුමේ වර්ෂය තුළ මුළු ලැබීම් රු.1,615,077 ක්වූ අතර එය මූල්‍ය කාර්යාසධන ප්‍රකාශයේ ආදායම් නොවන ලැබීම් යටතේ ඇතුළත් කර නොතිබීම නිසා සමාලෝචිත වර්ෂය සඳහා ආදායම් නොවන ලැබීම් එම ප්‍රමාණයෙන් අඩුවෙන් දක්වා තිබුණි. | 2018 නොවැම්බර් 21 දිනැති රාජ්‍ය ගිණුම් චක්‍රලේඛ අංක 267/2018 හි 3.6 ඡේදය ප්‍රකාරව මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය, පිළියෙල කළ යුත්තේ ඒසීඒ 1 සිට 6 දක්වා වූ ආකෘතීන්හි ඇතුළත් තොරතුරු හා සටහන් අංක **(i)** සිට **(viii)** දක්වා වූ විස්තර පදනම් කරගෙනය. | රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුමේ වර්ෂය තුළ මුළු ලැබීම් මූල්‍ය කාර්යසාධන ප්‍රකාශයේ අතපසු වීමකින් ඇතුළත් කර නොමැත. මේ පිළිබඳව විෂයභාර නිලධාරිනිය දැනුවත් කරන ලද අතර ඉදිරියේදී මෙවැනි වැරදි සිදු නොවීමට වගබලා ගන්නා බව දන්වමි. |
| **(ආ)** එක් ආදායම් ශිර්ෂයක් යටතේ වර්ෂය තුළ රැස්කළ රු.300,588 ක් වූ මුළු ආදායම ඒසීඒ - 3 ආකෘතිය යටතේ ඇතුළත් කර නොතිබුණි. ඒ අනුව සමාලෝචිත වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යය සාධන ප්‍රකාශයේ ආදායම් නොවන ලැබීම් යටතේ වෙනත් ආදායම් රු.300,588 ක් අඩුවෙන් දක්වා තිබුණි. | 2018 නොවැම්බර් 21 දිනැති රාජ්‍ය ගිණුම් චක්‍රලේඛ අංක 267/2018 හි7(ii) ඡේදය ප්‍රකාරව ආදායම් ගණන්දීමේ නිලධාරීන් වෙනුවෙන් ආදායම් එකතු කරනු ලබන වෙනත් දෙපාර්තමේන්තු එම රැස්කළ ආදායම භාණ්ඩාගාරයෙන් ලද අක්මුදල් ලෙස සලකා ඒසීඒ - 3 ආකෘතියේ ඇතුළත් කල යුතු වේ. | ආදායම් ශීර්ෂ 20 – 03 – 99 – 00 යටතේ වර්ෂය තුළ රැස්කළ රු.300,588 ක් වූ මුළු ආදායමෙන් රු.231,475.50 ක් භාණ්ඩාගාර නියෝජ්‍ය ලේකම් වෙත යවා ඇත. අප දෙපාර්තමේන්තුව බී ශ්‍රේණියේ දෙපාර්තමේන්තුවක්ව පැවති බැවින් රැස්කළ ආදායම භාණ්ඩාගාරයෙන් ලද අක්මුදලක් ලෙස නොසලකා භාණ්ඩාගාර නියෝජ්‍ය ලේකම් වෙත ආදායම් ශීර්ෂ 20 – 03 – 99 – 00 යටතේ බැර කරනු ලබයි.<br>ඉතිරි ආදායම වන රු.69,112.50 ක මුදල කාර්ය මණ්ඩලය සඳහා දීමනා වශයෙන් ගෙවා ඇත. විෂය භාර නිලධාරිනියගේ නොදැනුවත්කම මත මෙම ආදායම ඒසීඒ 03 ආකෘතිය යටතේ ඇතුළත් කර නොමැත. ඉදිරියේ දී මෙවැනි වැරදි සිදු නොවීමට වගබලා ගන්නා බව දන්වමි. |
| **(ඇ) අත්තිකාරම් ගෙවීම්**<br>---------------------<br>ඒසීඒ - 5 ආකෘතිය අනුව සමාලෝචිත වර්ෂය තුළ අත්තිකාරම් ගෙවීම රු.1,253,083 ක් වුවද මූල්‍ය | 2018 නොවැම්බර් 21 දිනැති රාජ්‍ය ගිණුම් චක්‍රලේඛ අංක 267/2018 හි 3.6 ඡේදය ප්‍රකාරව මූල්‍ය කාර්යසාධන | මූල්‍ය කාර්යසාධන ප්‍රකාශයේ අත්තිකාරම් ගෙවීම් ලෙස සටහන් කර ඇත්තේ රු.943,691 ක් වූ මුදලින් සිදුකළ අත්තිකාරම් ගෙවීම් පමණි. රු.309,392 |

| | | | |
|---|---|---|---|
| | කාර්යසාධන ප්‍රකාශයේ මෙය රු.943,691 ක් ලෙස දැක්වීම නිසා මූල්‍ය කාර්යසාධන ප්‍රකාශයේ මුළු වියදම රු.309,392 ක් අඩුවෙන් දක්වා තිබුණි. | ප්‍රකාශය, පිළියෙල කළ යුත්තේ ඒසීඒ 1 සිට 6 දක්වා වූ ආකෘතීන්හි ඇතුළත් තොරතුරු හා සටහන් අංක **(i)** සිට **(viii)** දක්වා වූ විස්තර පදනම් කරගෙනය. | ක්වූ හරස් සටහන් මඟින් සිදුකළ අත්තිකාරම් ගෙවීම් මූල්‍ය කාර්යසාධන ප්‍රකාශයේ සටහන් කර නොමැත. විෂය භාර නිලධාරිනියගේ නොදැනුවත්කම නිසා හරස් සටහන් මඟින් සිදුකළ ගනුදෙනු ඇතුළත් කර නොමැති බැවින් මින් ඉදිරියට මෙවැනි වැරදි සිදු නොවීමට වගබලා ගන්නා බව දන්වමි. |
| **(ඇ)** | සමාලෝචිත වර්ෂය අවසානයට දෙපාර්තමේන්තු වැය ලෙජරය හා භාණ්ඩාගාර පරිගණක මුද්‍රිත සටහන් අනුව වැටුප්, වේතන හා අනෙකුත් සේවක ප්‍රතිලාභ වැය විෂයයන්වල වියදම රු.7,233,215 ක්වූ නමුත් මූල්‍ය කාර්යසාධන ප්‍රකාශයේ එම වියදම රු.6,638,638 ක් ලෙස දැක්වීම නිසා මූල්‍ය කාර්යසාධන ප්‍රකාශයේ පුනරාවර්තන වියදම් රු.594,577 ක් අඩුවෙන් දක්වා තිබුණි. | 2018 නොවැම්බර් 21 දිනැති රාජ්‍ය ගිණුම් චක්‍රලේඛ අංක 267/2018 හි 3.6 ඡේදය ප්‍රකාරව මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය, පිළියෙල කළ යුත්තේ ඒසීඒ 1 සිට 6 දක්වා වූ ආකෘතීන් හි ඇතුළත් තොරතුරු හා සටහන් අංක **(i)** සිට **(viii)** දක්වා වූ විස්තර පදනම් කරගෙනය. | මෙය විෂය භාර නිලධාරිනියගේ නොදැනුවත්කම මත සිදු වූ වරදක් බැවින් මින් ඉදිරියට එවැනි වැරදි නොවීමට වගබලා ගන්නා බව කාරුණිකව දන්වමි. |
| **(ඉ)** | ආදායම් ශීර්ෂ 20 – 03 – 99 – 00 යටතේ සමාලෝචිත වර්ෂය තුළදී රැස් කරන ලද ආදායමින් රු.231,475 ක් භාණ්ඩාගාර නියෝජ්‍ය ලේකම් වෙත ප්‍රේෂණය කර තිබුණු අතර රු.69,113 ක් කාර්ය මණ්ඩලය සඳහා දීමනා වශයෙන් ගෙවා තිබුණි. මේ අනුව රු.300,588 ක්වූ මුළු වියදම, මූල්‍ය හා කාර්යසාධන ප්‍රකාශයේ ඇතුළත් කර නොතිබීම නිසා මුළු වියදම එම වටිනාකමින් අඩුවෙන් ගිණුම්ගත කර තිබුණි. | 2018 නොවැම්බර් 21 දිනැති රාජ්‍ය ගිණුම් චක්‍රලේඛ අංක 267/2018 හි 3.6 ඡේදය ප්‍රකාරව මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය, පිළියෙල කළ යුත්තේ ඒසීඒ 1 සිට 6 දක්වා වූ ආකෘතීන්හි ඇතුළත් තොරතුරු හා සටහන් අංක **(i)** සිට **(viii)** දක්වා වූ විස්තර පදනම් කරගෙනය. | රු.300,588 ක්වූ තැන්පතු ගෙවීම් වියදම විෂය භාර නිලධාරිනියගේ අතපසු වීමක් මත මූල්‍ය කාර්යසාධන ප්‍රකාශයේ ඇතුළත් කර නොමැත. මින් ඉදිරියට මෙවැනි වැරදි සිදු නොවීමට වගබලා ගන්නා බව දන්වමි. |

### 1.6.2 මූල්‍ය තත්ත්ව ප්‍රකාශය
-----------------------------

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| මූල්‍ය ප්‍රකාශන සමඟ වූ ඒසීඒ - 6 ආකෘතියේ වත්කම් කේත අංක 6112101 යටතේ දෙපාර්තමේන්තුව සතු මෝටර් රථයක් පිළිබඳ තොරතුරු ඇතුළත් කර නොතිබුණු අතර, ඒ අනුව මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශයේ දේපල පිරියත හා උපකරණ ශේෂයත්, දේපල පිරියත හා උපකරණ සංචිත ශේෂයත් අඩුවෙන් දක්වා තිබුණි. | 2018 නොවැම්බර් 21 දිනැති රාජ්‍ය ගිණුම් චක්‍රලේඛ අංක 267/2018 හි 3.6 ඡේදය ප්‍රකාරව මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය, පිළියෙල කළ යුත්තේ ඒසීඒ 1 සිට 6 දක්වා වූ ආකෘතීන්හි ඇතුළත් තොරතුරු හා සටහන් අංක **(i)** සිට **(viii)** දක්වා වූ විස්තර පදනම් කරගෙනය. | වත්කම් කේත අංක 6112101 යටතේ දෙපාර්තමේන්තුව සතු අදාල මෝටර් රථය අධිකරණ හා බන්ධනාගාර ප්‍රතිසංස්කරණ අමාත්‍යාංශයෙන් අප දෙපාර්තමේන්තුවට ලබාදී ඇති වත්කමක් බැවින් එම මෝටර් රථය පිළිබඳ තොරතුරු දේපල පිරියත උපකරණ යටතේ දක්වා නොමැත. එබැවින් මෝටර් රථය දේපල පිරියත උපකරණ යටතේ සටහන් කිරීමට අවශ්‍ය කටයුතු සිදු කරන මෙන් අදාල විෂය භාර නිලධාරීන් දැනුවත් කරන ලදී. |

### 1.6.3 මුදල් ප්‍රවාහ ප්‍රකාශය
-----------------------

පහත සඳහන් නිරීක්ෂණය කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| ඒසීඒ - 5 ආකෘතිය අනුව රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුමේ වර්ෂය තුළ මුදලින් හර කිරීම් හා බැර කිරීම් අතර වෙනස රු.594,557 ක් විය. එහෙත් සමාලෝචිත වර්ෂය සඳහා වූ මුදල් ප්‍රවාහ ප්‍රකාශයේ තැන්පත් ගිණුම් හා අනෙකුත් වගකීම්වල වෙනස් වීම රු.943,691 ක් ලෙස දැක්වීම නිසා මුදල් ප්‍රවාහ ප්‍රකාශයේ මූල්‍ය ක්‍රියාකාරකම් සඳහා වැය කරන ලද මුළු මුදල් ප්‍රවාහය රු.349,134 ක් වැඩියෙන් ගිණුම්ගත කර තිබුණි. | 2018 නොවැම්බර් 21 දිනැති රාජ්‍ය ගිණුම් චක්‍රලේඛ අංක 267/2018 හි 3.6 ඡේදය ප්‍රකාරව මුදල් ප්‍රවාහ ප්‍රකාශය පිළියෙල කළ යුත්තේ ඒසීඒ 1 සිට 6 දක්වා වූ ආකෘතීන්හි ඇතුළත් තොරතුරු හා සටහන් අංක **(i)** සිට **(viii)** දක්වා වූ විස්තර පදනම් කරගෙනය. | මුදල් ප්‍රවාහ ප්‍රකාශයේ දක්වා ඇත්තේ රජයේ නිලධාරීන්ගේ අත්තිකාරම් ගිණුමේ වර්ෂය තුළ මුදලින් සිදුකළ හර කිරීම් පමණි. විෂය භාර නිලධාරිනියගේ නොදැනුවත්කම නිසා සිදු වූ වරදක් බැවින් මින් ඉදිරියට මෙවැනි වැරදි සිදු නොවීමට වගබලා ගන්නා බව කාරුණිකව දන්වමි. |

### 1.6.4 සීමා ඉක්මවීම්

රජයේ අත්තිකාරම් කාර්යයන් සඳහා පාර්ලිමේන්තුව විසින් පනවා තිබුණු සීමාවන් ඉක්මවීම් හා ළඟා නොවීම් පිළිබඳ පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| විෂය අංක 23101 දරන රජයේ නිලධාරීන්ට අත්තිකාරම් බී ගිණුම වෙනුවෙන් පනවා තිබුණු අවම ලැබීම් සීමාව රු.400,000 ක් වූ නමුත් වර්ෂය තුල තථ්‍ය ලැබීම් රු. 349,134 ක් වීම නිසා ලැබීම් සීමාවට ලඟානොවීම රු.50,866 ක් විය. | ජාතික අයවැය අධ්‍යක්ෂ ජනරාල්ගේ අංක 118 හා 2004 ඔක්තෝබර් 11 දිනැති රජයේ නිලධාරීන්ගේ අත්තිකාරම් බී ගිණුමට අදාල උපදෙස් ඇතුළත් චක්‍රලේඛයේ 2.1 ඡේදය ප්‍රකාරව අමාත්‍යාංශ හා දෙපාර්තමේන්තු අතර ණය ශේෂ පියවීමේදී පැන නඟින්නා වූ හර කිරීම් හා බැර කිරීම් උපරිම සීමාව තුළ සහ අවම ලැබීම් සීමාව තීරණය කිරීමේදී ගණන් නොගත යුතු වේ. | මෙම දෙපාර්තමේන්තුවට අයත් අත්තිකාරම් බී ගිණුමෙහි සත්‍ය ලැබීම් රු.349,134 වීම නිසා රු.50,866 කින් අවම ලැබීම් සීමාවට ලඟා වීමට නොහැකි වී ඇත. එබැවින් දෙපාර්තමේන්තුවේ අවම ලැබීම් සීමාව රු.349,134 ක් ලෙස සංශෝධනය කිරීම සඳහා ජාතික අයවැය දෙපාර්තමේන්තුව විසින් මුදල් හා ජන මාධ්‍ය අමාත්‍යතුමාගේ නිර්දේශය සඳහා ඉදිරිපත් කළ බවට **BD/PE2/76101/03/2002** හා 2019 පෙබරවාරි 25 දිනැති ලිපිය මඟින් අප වෙත දන්වා ඇත. ඉදිරියට මෙවැනි දෝෂ නොවීමට කටයුතු කරමි. |

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 වියදම් කළමනාකරණය

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| මූලධන වැය විෂයන් 03 ක් හා පුනරාවර්තන වැය විෂයන් 09 සඳහා සලසා තිබුණු මුළු ශුද්ධ ප්‍රතිපාදනය වූ රු.මිලියන 27.04 කින් රු.මිලියන 13.53 ක් හෙවත් ශුද්ධ ප්‍රතිපාදන වලින් සියයට 21 සිට සියයට 74 දක්වා පරාසයක ප්‍රතිපාදන ඉතිරි වී තිබුණි. | මුදල් රෙගුලාසි 50 හි දැක්වෙන විධි විධාන ප්‍රකාරව සකසුරුවම්කම හා කාර්යක්ෂමතාවය ගැන නිසි සැලකිල්ලෙන් නිවැරදිව වියදම් ඇස්තමේන්තුව පිළියෙල කළයුතු වේ. | ප්‍රතිපාදන ඉතිරි වීමට පහත කරුණු හේතු විය.<br>(i) ලේකම් තනතුර පුරප්පාඩු වී පැවතීම නිසා ලේකම් වෙනුවෙන් වෙන්කරන ලද මෝටර් රථයේ වැඩිදියුණු කිරීම් නොවීම හා රියදුරු තනතුර පුරප්පාඩු වීම.<br>(ii) අපේක්ෂිත ගෘහ භාණ්ඩ මිල දී ගැනීමට නොහැකි වීම.<br>(iii) පුරප්පාඩු හේතුවෙන් නිලධාරීන් පුහුණු වැඩසටහන් සඳහා යොමු කිරීමට නොහැකි වීම.<br>(iv) අපේක්ෂිත ජංගම වැඩසටහන් ප්‍රමාණයට වඩා අඩු ප්‍රමාණයක් ක්‍රියාත්මක වීම.<br>(v) මණ්ඩලයේ සමාජික දීමනා සංශෝධනය පාර්ලිමේන්තුවේ දී අනුමත වී නොතිබීම.<br>(vi) ලේකම් තනතුර සඳහා ඉන්ධන දීමනා ප්‍රතිපාදන ඉතිරි වීම හා 2018 මැයි මස සිට 2018 ඔක්තෝබර් මස දක්වා රියදුරු තනතුර පුරප්පාඩු වීම.<br>(vii) පරිගණක යන්ත්‍ර හා ඡායා පිටපත් යන්ත්‍ර අරපිරිමැස්මෙන් භාවිතා කිරීම නිසා නඩත්තු වියදම් අවම වීම.<br>(viii) දෙපාර්තමේන්තුව වැඩි ඉඩකඩ සහිත ස්ථානයක් වෙත රැගෙන යාමේ අපේක්ෂාවෙන් ප්‍රතිපාදන වෙන් කල ද එය ක්‍රියාත්මක කිරීමට නොහැකි වීම.<br>(ix) නිවාස / දේපළ ණය ලබා ගත් නිලධාරීන් අඩුවීම. |

## 2.2 බැංකු ගිණුම් මෙහෙයවීම

පහත සඳහන් නිරීක්ෂණය කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| 2018 දෙසැම්බර් 31 දිනට එක් බැංකු ගිණුමක මාස 06 කට වැඩි කාලයක් මුදල් නොකළ රු.14,350 ක් වටිනා චෙක්පත් 06 ක් සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි 396 (ඇ) පරිදි කටයුතු කර නොතිබුණි. | මාස 06 කට වැඩි කාලයක් මුදල් නොකළ චෙක්පත් සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි 396 (ඇ) ප්‍රකාරව කටයුතු කළ යුතු වේ. | මාස 06 කට වැඩි කාලයක් මුදල් නොකළ චෙක්පත් සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි 396 (ඇ) ප්‍රකාරව එම චෙක්පත්වලට මුදල් නොගෙවන බව බැංකුවෙන් තහවුරු කරගෙන ඇති අතර අනෙකුත් අවශ්‍ය කටයුතු සිදු කර ඇති බව දන්වමි. |

## 3. මෙහෙයුම් සමාලෝචනය

### 3.1 කාර්යය සාධනය

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| 2011 වර්ෂයේ සිට 2018 වර්ෂය දක්වා පසුගිය වර්ෂ 08 ක කාලය තුල දෙපාර්තමේන්තුවේ කාර්යසාධනයට අදාලව විසඳී ඇති නඩු ප්‍රතිශතය මුළු නඩු සංඛ්‍යාවෙන් සියයට 29 සිට සියයට 51 දක්වා පරාසයක ප්‍රමාණයක් ගෙන තිබුණි. තවද ඉහත කාලය තුළ වාර්ෂිකව දෙපාර්තමේන්තුවට අළුතින් ලැබුණු අයදුම්පත් සංඛ්‍යාව 388 සිට 514 ක් අතර ප්‍රමාණයක් ගෙන තිබුණි. 2018 වර්ෂය තුළ ලියාපදිංචි වී ඇති නඩු සංඛ්‍යාව 381 ක්වූ අතර එමඟින් දිස්ත්‍රික්ක 18 ක් නියෝජනය කරයි.මේ අනුව දිවයිනේ සියලු ප්‍රදේශ වලින් 2018 දෙසැම්බර් 31 දිනට විසඳීමට ඇති මුළු නඩු සංඛ්‍යාව 785 ක්වූ අතර එම සංඛ්‍යාවෙන් සියයට 25 ක පමණ ප්‍රමාණයක් වසර 03 කට වඩා පැරණි නඩු බව නිරීක්ෂණය විය. | දෙපාර්තමේන්තුව පිහිටුවීමේ ප්‍රධාන අරමුණ නිශ්චල දේපල සම්බන්ධයෙන් උකස් කර, පොරොන්දු සින්නක්කර හා හුදෙක් ණය ගනුදෙනුවක් සඳහාම ලියන ලද සින්නක්කර ඔප්පු හා අනෙකුත් බැඳීම් කෙරෙහි අයවියයුතු ණය පිළිබඳව සම්මුතිවලට පාර්ශවයන් පැමිණ වීම බැවින් එම අරමුණු ඉටු කර ගැනීම කෙරෙහි විශේෂ අවධානය යොමු කළයුතු වේ. | පසුගිය වසර කිහිපය පුරා පැවති ජනපති නිල මෙහෙවර ඇතුළු මහජනතාව දැනුවත් කිරීමේ වැඩසටහන්වලට සහභාගී වීම හේතුවෙන් වාර්ෂිකව ලද ඉල්ලුම් පත් සංඛ්‍යාව වර්ධනය විය. තවද දෛනිකව මණ්ඩලය වෙත කැඳවන නඩු සංඛ්‍යාව ඉහළ දැමීමත් සමඟ විසඳී ඇති නඩු ප්‍රතිශතය ද ඉහළ ගොස් ඇත. මෙම දෙපාර්තමේන්තුවට අනුබද්ධිත ශාඛා මණ්ඩල කාර්යාල 05 ක් ගම්පහ, කළුතර, කුරුණෑගල, මාතර හා මහනුවර දිස්ත්‍රික්ක ආවරණය වන පරිදි පිහිටු වීම සඳහා කටයුතු පිළියෙල කරමින් පවතී. මූලික වශයෙන් ගම්පහ ශාඛා මණ්ඩලය ස්ථාපිත කිරීමට අදාලව මූලික කටයුතු සිදු කරමින් පවතින අතර 2019 ජූලි මස ගම්පහ ශාඛාව ආරම්භ |

| | | |
|---|---|---|
| | | කිරීමට කටයුතු සිදු කරමින් පවතී.<br><br>වසර 03 කට වඩා පැරණි නඩු පාර්ශවකරුවන්ගේ නොපැමිණීම හා අදාල සාක්ෂි ලබා ගැනීම් ප්‍රමාද වීම් හේතුවෙන් සමථයකට පත් කිරීමට ප්‍රමාද වුවද ණය සහනදායක මණ්ඩලය විසින් එම නඩු සමථයකට පත් කිරීම සම්බන්ධයෙන් කටයුතු කරමින් පවතී. |

**3.2 සැලැසුම් කිරීම**

----------------

| විගණන නිරීක්ෂණ<br>--------------------- | නිර්දේශය<br>---------------- | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම<br>------------------------------------- |
|---|---|---|
| 2014 පෙබරවාරි 17 දිනැති අංක 2014/01 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛය ප්‍රකාරව දෙපාර්තමේන්තුවේ ප්‍රධාන කාර්යභාරයන් හා අපේක්ෂිත ප්‍රතිඵල ලබා ගැනීම සඳහා 2018 වර්ෂයට පිළියෙල කර තිබුණු ක්‍රියාකාරී සැලැස්ම තුළ සංවිධාන ව්‍යුහය, අනුමත හා තත්‍ය කාර්ය මණ්ඩලය, ක්‍රියාකාරී සැලැස්ම, කාල රාමුව, ක්‍රියාකාරකම්වල අපේක්ෂිත ප්‍රතිඵල/නිමවුම, හා අක්මුදල් සැලැස්ම ආදිය ඇතුළත්ව නොතිබුණු නිසා එම ක්‍රියාකාරී සැලැස්ම උක්ත චක්‍රලේඛය ප්‍රකාරව සකස් කර නොමැති බව නිරීක්ෂණය විය. | **2014** පෙබරවාරි 17 දිනැති අංක 01/2014 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛය ප්‍රකාරව 2018 වර්ෂය සඳහා ක්‍රියාකාරී සැලැස්ම පිළියෙල කළ යුතු වේ. | 2019 වර්ෂය සඳහා වන ක්‍රියාකාරී සැලැස්ම අදාල චක්‍රලේඛය ප්‍රකාරව පිළියෙල කිරීමට කටයුතු සිදු කර ඇත. |

### 3.3 වත්කම් කළමනාකරණය

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| දෙපාර්තමේන්තුව විසින් 2018 වාර්ෂික භාණ්ඩ සමීක්ෂණ වාර්තාව 2019 මාර්තු 15 දින ඉදිරිපත් කර තිබුණ ද භාණ්ඩ ඌනතා හා අතිරික්ත වාර්තා කිරීම් සම්බන්ධයෙන් ක්‍රියාමාර්ග ගැනීමක් සිදු වී නොතිබුණි. එසේම පොදු 47 වාර්තාව අනුව අපහරණය කළ යුතු භාණ්ඩ වර්ගීකරණයක් ද සිදු කර නොතිබුණි. | 2016 මාර්තු 31 දිනැති අංක 05/2016 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛය ප්‍රකාර 2018 වාර්ෂික භාණ්ඩ සමීක්ෂණය සිදු කර එම වාර්තා චක්‍රලේඛයේ 3.1.6 ඡේදය ප්‍රකාරව 2019 මාර්තු 17 දිනට ප්‍රථම විගණකාධිපති වෙත ඉදිරිපත් කළ යුතුවේ. | 2018 භාණ්ඩ සමීක්ෂණ වාර්තාව අදාල චක්‍රලේඛයට අනුව කටයුතු සිදු කිරීමට නොහැකි වූ අතර 2019 භාණ්ඩ සමීක්ෂණය අදාල චක්‍රලේඛයට අනුකූලව කටයුතු සිදු කිරීමට අවශ්‍ය උපදෙස් ලබා දී ඇත. |

### 4. මානව සම්පත් කළමනාකරණය

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| **(අ)** ජ්‍යෙෂ්ඨ මට්ටමට අයත් ලේකම් තනතුර වසර පහකට වැඩි කාලයක සිට පුරප්පාඩුව පවතින අතර, එම තනතුර සඳහා වරින් වර වැඩ බැලීමේ පත්වීම් ලබාදී තිබුණි. මේ වන විටද ලේකම් තනතුර සඳහා බඳවා ගැනීමේ පරිපාටිය සංශෝධනය කිරීමට කටයුතු කරගෙන යමින් පැවතුණි. | පුරප්පාඩු සම්පූර්ණ කිරීමට කටයුතු කළ යුතු වේ. | දෙපාර්තමේන්තුවේ ලේකම් තනතුර වසර 05කට වැඩි කාලයක සිට පුරප්පාඩුව පවතින අතර එම තනතුර සඳහා වරින්වර වැඩ බැලීමේ පත් වීම් ලබා දී තිබුණි. මේ වන විට ලේකම් තනතුර සඳහා අයදුම්පත් කැඳවා බඳවා ගැනීමේ කටයුතු අධිකරණ හා බන්ධනාගාර ප්‍රතිසංස්කරණ අමාත්‍යාංශය විසින් සිදු කරමින් පවතී. |
| **(ආ)** ද්විතීයික මට්ටමට අයත් අනුමත ලඝු ලේඛක තනතුරු තුනම 2013 වර්ෂයටත් පෙර සිට පුරප්පාඩුව පවතින අතර 2014 ජූනි මස සිට අධිකරණ අමාත්‍යාංශයෙන් අනුයුක්ත කරන ලද ලඝු ලේඛකයින් දෙදෙනෙකු මඟින් | - එම - | දෙපාර්තමේන්තුවේ ලඝුලේඛන තනතුරු තුනම පුරප්පාඩුව පවතින අතර අධිකරණ අමාත්‍යාංශයෙන් අනුයුක්ත කරන ලද ලඝු ලේඛකයින් දෙදෙනකු මඟින් කටයුතු කරගෙන යනු ලබයි. මේ වන විට ලඝු ලේඛක බඳවා ගැනීමේ පටිපාටිය සංශෝධනය |

කටයුතු කරගෙන යනු ලබයි. බඳවා ගැනීමේ පටිපාටිය අනුමත වීමෙන් පසුව පවත්වන ලද තරඟ විභාගයටද ඊට අදාල සුදුසුකම් සම්පූර්ණ කළ ලසු ලේඛකයන් නොමැති වීම මත තවදුරටත් පුරප්පාඩුව එලෙසම පැවතුනි.

කර අනුමැතිය සඳහා අධිකරණ හා බන්ධනාගාර ප්‍රතිසංස්කරණ අමාත්‍යාංශය වෙත ඉදිරිපත් කර ඇත.